# කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

### ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය – 2016/2017

### SOC 4239 - සහයෝගීත්ව සමාජ කාර්යවේදය

පැ දෙකයි (02)

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න

*විභාග කාලය තුළදී ක්ෂේත්‍ර සටහන් පොත පරිශීලනය කිරීමට අවසර ලැබේ.*

---

1. සහයෝගීත්ව සමාජ කාර්යවේදියකු වශයෙන් ප්‍රජාව සමඟ වැඩ කිරීමේ සම්බන්ධතාවක් (working relationship) ගොඩ නඟා ගැනීමේදී අවධානය යොමු කළ යුතු මූලික කරුණු මොනවාදැයි, ඔබගේ ප්‍රායෝගික පුහුණු වැඩ ඇසුරෙන් නිදර්ශන සපයමින් විස්තර කරන්න.

2. පූර්ව නූතන, නූතන සහ පශ්චාත් නූතන අවධීන්හිදී 'යථාව' සහ 'අස්මිතාව' පිළිබඳ ගොඩ නැගුණු සහයෝගීත්ව සමාජ කාර්යවේදීය මීමංසාව පිළිබඳ කතිකාව විචාර පූර්වකව සාකච්ඡා කරන්න.

3. ලීනා ඩොමිනෙල්ලි විසින් ඉදිරිපත් කරන ලද, සමාජ කාර්යවේදීය සංවර්ධනය පිළිබඳ පරහිතකාමිත්වයේ (Altruism) සිට සහකාරීත්වය (Partnership) දක්වා වන මූලික අවධි යෝග්‍ය නිදර්ශන භාවිත කරමින් විභාග කරන්න.

4. සහයෝගීත්ව සමාජ කාර්යවේදය තුළ සහ-කාර්ය භූමිකාව (Synergetic role) ප්‍රායෝගිකව භාවිත කළ හැකි ආකාරය ඔබගේ ප්‍රායෝගික පුහුණු වැඩ ඇසුරෙන් නිදර්ශන සපයමින් විස්තර කරන්න.

අ.පි.බ

5. සහ-නිර්මාණය (Co-creation) යන සංකල්පය නිර්වචනය කොට, පවුල් ඒකක සමඟ සහයෝගීත්ව සමාජ කාර්යවේදීය භාවිතාවන්හි යෙදීමේදී සමාජ කාර්යවේදියා විසින් එකී සහ-නිර්මාණය භාවිත කරනු ලබන ආකාරය, ශ්‍රී ලාංකේය සන්දර්භය කෙරෙහි විශේෂ අවධානය සහිතව සාකච්ඡා කරන්න.

6. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම <u>දෙකක් (02)</u> පිළිබඳව කෙටි රචනා ලියන්න.

i ආඛ්‍යාන එළඹුම (Narrative approach)

ii සහයෝගීත්ව සමාජකාර්යවේදය තුළ සත්‍යාන්ත්‍රික පාලනය (Cybernetics)

iii සමාජ කාර්යවේදය පිළිබඳ අන්තර්ජාතික නිර්වචනයේ සීමා

iv සහයෝගිත්ව සමාජ කාර්යවේදයේ භාෂාව

******************